# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

**AAT/91/2022 (NPC)**

එන්.ආර්.ආර්.එස්.කරුණාරත්න,
**අභියාචක**
**එදිරිව**
ජාතික පොලිස් කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

**දිනය :-2026.07.22**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රජයේ සේවක තිස්ස ගුණතිලක මහතා,
වගඋත්තරකාර ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂ මාලා බස්නායක මහත්මිය.

## -<u>නියෝගය</u>-

## විනිසුරු කේ.ටී.චිත්‍රසිරි මැතිතුමා

එන්.ආර්.ආර්.එස් කරුණාරත්න නැමැති අභියාචක විසින් මෙම විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කර ඇති 2022.12.23 දිනැති අභියාචනා පෙත්සම මගින් ඉල්ලා ඇත්තේ, ඔහු වෙත නිකුත් කර ඇති විනය නියෝගයෙන් ඔහු නිදොස් කොට නිදහස් කර හෝ එම නියෝගය සංශෝධනය කර, ඔහු වෙත පොලිස් පරීක්ෂක තනතුරට උසස්වීම ලබා දීමට අවශ්‍ය කටයුතු සිදුකර දෙන ලෙසයි. එසේ නම් මෙහිදී තීරණය කළ යුතු වන්නේ, අභියාචක වෙත නිකුත් කර ඇති විනය නියෝගය වැරදි සහගත විනය නියෝගයක් ද යන්නයි.

අභියාචක වෙත නිකුත් කර ඇති විනය නියෝගය, 2020.06.30 දිනැති ලිපිය මගින්, නැගෙනහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති

විසින් අභියාචක වෙත දැනුම් දී ඇත. එකී විනය නියෝගයේ සඳහන් වන්නේ, අභියාචකට එරෙහිව ඉදිරිපත් කර තිබූ චෝදනා තුන සම්බන්ධයෙන්, විධිමත් විනය පරීක්ෂණය පැවැත්වූ විනය පරීක්ෂණ නිලධාරියා විසින් අභියාචකට එරෙහිව ඉදිරිපත් කර තිබූ චෝදනා තුනටම අභියාචක වැරදිකරු බවට පත්කර තිබූ බවයි. එම කරුණු සළකා බලා දඬුවමක් වශයෙන් අභියාචකගේ එක් වැටුප් වර්ධකයක් විලම්භනය කිරීමට තීරණය කර ඇත. ඒ අනුව පෙනී යන්නේ ඉහත කී විනය දඬුවම අභියාචක වෙත පනවා ඇත්තේ, ඔහුට එරෙහිව පවත්වන ලද විධිමත් විනය පරීක්ෂණයකින් අනතුරුව බවයි. එසේ නම් මෙහිදී සළකා බැලිය යුත්තේ, අභියාචකට එරෙහිව ඉදිරිපත් කර තිබූ චෝදනා තුනටම අභියාචක වැරදිකරු කර තිබීම දෝෂ සහිත වන්නේ ද යන්නයි.

අභියාචකට එරෙහිව ඉදිරිපත් කර තිබූ චෝදනා තුනටම පදනම වී ඇත්තේ, ඔහු එප්පාවල පොලිස් ස්ථානයට අනුයුක්තව රාජකාරී කරමින් සිටියදී, රූපසිංහ ආරච්චිලාගේ චන්ද්‍රා කල්‍යානි හා ඇයගේ ස්වාමිපුරුෂයා වන ප්‍රියන්ත කුමාර දිසානායක යන දෙදෙනා විසින් කරන ලද පැමිණිල්ලකට අදාළ සැකකරුවකු වන පුද්ගලයෙකු, අභියාචකගේ භාරයට පත් කිරීමෙන් අනතුරුව, එම සැකකරුට පොලිස් ස්ථානයෙන් පලායාමට ඔහු විසින් ඉඩ ප්‍රස්ථාව ලබා දී ඇතැයි කියනු ලබන සිද්ධියකි.

ඉහත කී චෝදනා ඔප්පු කිරීම සඳහා චන්ද්‍රා කල්‍යානි, ප්‍රියන්ත කුමාර දිසානායක, සම්පත් ප්‍රේමදාස, හින්බංඩාගේ කරුණාරත්න, ධම්මිකා ඒකනායක, පුංචි බණ්ඩාගේ කුලතුංග, ප්‍රියන්ත රෝහණ අධිකාරී සහ කේ.අනුර සිල්වා යන සාක්ෂිකරුවන්, සාක්ෂියට කැඳවා ඇත. චන්ද්‍රා කල්‍යානි, ප්‍රියන්ත කුමාර දිසානායක යන දෙදෙනා සාක්ෂි දෙමින් පවසා ඇත්තේ, ඔවුන් දෙදෙනා ඔවුන්ගේ යතුරු පැදිය සොරාගත් බවට, තාරුක සංජීව යන අයට එරෙහිව පැමිණිල්ලක් කිරීම සඳහා එප්පාවල පොලිස් ස්ථානයට පැමිණි බවයි. ඉන් අනතුරුව පොලිස් ස්ථානාධිපති විසින් ඉහත කී තාරුක යන අය කැඳවා ඔහුගෙන් මේ පිළිබඳව විමසා සිටි බවත්ය. තාරුක සංජීව එම ස්ථානයට පැමිණි පසුව ස්ථානාධිපති විසින් ඉහත නම් සඳහන් සාක්ෂිකරුවන් වෙත දන්වා ඇත්තේ, එකී තාරුක සංජීව යන අය සමඟ ගොස් පැමිණිල්ල සටහන් කරන ලෙසටයි. අනතුරුව ඔවුන් දෙදෙනා තාරුක සංජීව යන අය සමඟ අපරාධ අංශයට ගිය බවත්, ඉන් පසුව තාරුක සංජීව යන අය එම ස්ථානයෙන් පැන ගිය බවත් ය.

තාරුක සංජීව පොලිස් භාරයෙන් පැන ගිය බව විවාදයෙන් තොරව පිළිගෙන ඇත. එසේ නම් මෙහිදී තීරණය කළ යුතු එකම කරුණ වන්නේ, ඉහත කී තාරුක යන අය, අභියාචකගේ භාරයට පත්ව තිබුනේ ද යන්න සහ එම කාලය තුළ තාරුක යන අය ඔහුගේ භාරයෙන් මිදී ගොස් තිබුණේද යන්නයි. එබැවින් මෙහිදී තීරණය කළ යුතු ප්‍රධාන කරුණ වන්නේ, තාරුක සංජීව යන අය පොලිස් භාරයෙන් මිදී යන අවස්ථාව වන විට, ඔහුගේ භාරකාරත්ව අභියාචක වෙත පැවරී තිබුනේද යන්නයි.

ප්‍රියන්ත රෝහන අධිකාරී යන අය සාක්ෂි දෙමින් පවසා ඇත්තේ, සැකකරු වන තාරුක සංජීව යන අය එවකට අපරාධ අංශයේ ස්ථානාධිපතිව සිටි අභියාචක වෙත භාරදුන් බවයි. ඒ බව දක්වෙන ඔහුගේ සාක්ෂිය පහත දක්වේ.

පි **"ඞී ගණයේ අපරාධයට අදාළ මාගේ ස්ථානයේ පො.ස.38401 කුලතුංග නිලධාරියාට දැනුම් දුන් පරිදි මා විසින් එවකට අපරාධ අංශයේ සේවය කළ උ.පො.ප.සමීර කරුණාරත්න නිලධාරියා මාගේ කාර්යාලයට කැඳවා, පොලිස් සැරයන් ලබාදුන් තොරතුරු අනුව පො.සා.වරයා ලවා අදාළ සැකකරු සුළු පැමිණිලි අංශයේ මාගේ කාර්යාලයට කැඳවා උ.පො.ප. සමීර කරුණාරත්න වෙත භාරදී, ඞී ගණයේ අපරාධයකට අදාළව සැකකරු බවත්, මෙම සැකකරුට අදාළව නීතිමය ක්‍රියා මාර්ග ගන්නා ලෙසත්, උපදෙස් ලබාදුන්නා. සැකකරු මාගේ කාර්යාලයේ දී උ.පො.ප.සමීර කරුණාරත්න වෙත භාරදුන්නා. ඉන්පසුව මට දැන ගන්නට ලැබුණා උපසේවක නිලධාරියා සහ සුළු කම්කරු කරුණාරත්න යන අයගෙන් මෙම සැකකරු අපරාධ අංශයට යන පඩි පේලියේ අසල සිට තනිකඩ හට නිවාසයේ පැත්තෙන් තාප්පයෙන් පැනලා ගිය බව."**

මෙම නිලධාරියා හරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් පවසා ඇත්තේ, තාරුක නැමැති පුද්ගලයා අභියාචක වෙත භාරදීමේ දී ලිඛිත සටහනක් නොයෙදූ බවත්, එම කාර්ය වාචිකව ඔහුට දැන්වූ බවත් ය. එම සාක්ෂිකරුගෙන් දීර්ඝ වශයෙන් හරස් ප්‍රශ්න ද අසා ඇත. නමුත් තාරුක යන පුද්ගලයා අභියාචකගේ භාරයට පත් කිරීම සම්බන්ධයෙන් ඔහු විසින් දෙන ලද සාක්ෂිය බිඳ හෙළිමක් සිදුවී නැත.

ඉහතින් සඳහන් කරන ලද, චන්ද්‍රා කල්‍යානි සහ ප්‍රියන්ත කුමාර දිසානායක යන සාක්ෂිකරුවන් දෙදෙනා විසින් ද සාක්ෂි දී ඇත්තේ, ඔවුන් දෙදෙනා ඉදිරියේ දී පොලිස් ස්ථානාධිපතිවරයා විසින් අභියාචක වෙත දන්වා සිටියේ, තාරුක යන අය කැඳවා ගෙන ගොස් ඔහුගෙන් ප්‍රකාශයක් ලබාගන්නා ලෙසට ය. එම සාක්ෂි මගින් ද පෙනී යන්නේ තාරුක යන අයගේ භාරකාරත්වය අභියාචක වෙත, පොලිස් ස්ථානාධිපතිවරයා විසින් පවරා තිබූ බවයි.

ඉහතකී අයුරින් තාරුක යන අයගේ භාරකාරත්වය අභියාචක වෙත පැවරීමෙන් අනතුරුව, ඔහුගේ භාරයෙන් පැන යාමට තාරුකට ඉඩනොදීමේ වගකීම පොලිස් නිලධාරියෙකු ලෙස අභියාචක වෙත පැවරෙන රාජකාරියයි. එම වගකීම අභියාචක පැහැර හැර ඇති බව ඉදිරිපත් වී ඇති සාක්ෂි වලින් පෙනී යයි.

මෙහිදී සඳහන් කළ යුතු තවත් කරුණක් වන්නේ, අභියාචක විසින් මෙම විනිශ්වය අධිකාරය වෙත ඉදිරිපත් කර ඇති අභියාචනා පෙත්සමේ පළවන ජේදයේ ම සඳහන් කර ඇත්තේ, ඉහතකී තාරුක යන සැකකරු සම්බන්ධයෙන් ඉදිරි පියවර ගන්නා ලෙසට ස්ථානාධිපති විසින් වාචික නියෝගයක් ඔහු වෙත ලබාදුන් බවයි. ඉන් අනතුරුව සැකකරු සම්බන්ධයෙන් ඉදිරි පියවර ගැනීමට සූදානම් වූ අවස්ථාවේ දී, ඔහු පොලිස් ස්ථානයෙන් පලා ගිය බව, එහි වැඩිදුරටත් සඳහන් කර ඇත. ඒ මගින්ම පෙනී යන්නේ තාරුක නැමැති සැකකරු අභියාචකගේ භාරය යටතට පත්වීමෙන් අනතුරුව, ඔහුගේ භාරකාරත්වයෙන් මිදී තාරුක පැන ගොස් ඇති බවයි.

එම කරුණු අභියාචනා පෙත්සමෙහි එසේ සටහන් කරමින් අභියාචක සඳහන් කර ඇත්තේ, කිසියම් සැකකරුවෙකුට විරුද්ධව පැමිණිල්ලක් සටහන් කර ගන්නා තෙක් එම සැකකරු පොලිස් අත්අඩංගුවට ගැනීමට නීතියෙන් ඉඩක් නොමැති නිසා, තාරුකගේ පැනයාමට ඔහු වගකිව නොයුතු බවයි. නමුත් කිසියම් සංඥය වරදක් සිදුකරන ලද අවස්ථාවකදී ඒ සම්බන්ධයෙන් පැමිණිල්ලක් සටහන් කරන තුරු ඔහුව අත්අඩංගුවට නොගෙන සිටීම ප්‍රායෝගික නොවේ. කෙසේ වෙතත් මෙම අවස්ථාවේ දී පලාගිය තාරුක නැමැති පුද්ගලයා, පලා යන අවස්ථාව වන විට අභියාචකගේ භාරයේ සිට බවට පැහැදිලිව සාක්ෂි මගින් තහවුරු වී ඇත. එසේ නම් ඉදිරිපත් කර ඇති චෝදනා තුනට අභියාචක වරදකරු බවට පත් කිරීමෙහි දෝෂයක් පෙනෙන්නට නැත.

මෙම අවස්ථාවේ දී අභියාචකට එරෙහිව නිකුත් කර ඇති විනය නියෝගය සංශෝධනය කිරීමට තරම් කරුණු තිබේද යන්නට ද විනිශ්චය අධිකාරයේ අවධානය යොමු කරන ලදි. චෝදනාලත් පුද්ගලයෙකුව අත්අඩංගුවෙන් මිදී යෑමට ඉඩ සැළැස්වීම බරපතල ගණයේ වරදකි. එම වරදට වරදකරු බවට පත්කර ඇති අභියාචක වෙත නිකුත් කර ඇත්තේ එක් වැටුප් වර්ධකයක් විලම්භනය කිරීම පමණි. එබැවින් වරදකරු බවට පත්කර ඇති චෝදනාවේ ස්වභාවය සළකා බලන විට ඒ සම්බන්ධයෙන් පනවා ඇති දඬුවම ලිහිල් කිරීමට තරම් කරුණු ඉදිරිපත් වන්නේ නැත.

ඉහත සඳහන් හේතුන් සළකා බලා, අභියාචකට එරෙහිව නිකුත් කර ඇති විනය දඬුවම ඒ ආකාරයෙන්ම පවත්වා ගෙන යායුතු බවට වැඩිදුරටත් තීරණය කරමු.

ඉහත හේතුන් සළකා බලා අභියාචක විසින් ඉදිරිපත් කර ඇති අභියාචනය නිශ්ප්‍රභ කිරීමට තීරණය කරමු.

අභියාචනය නිශ්ප්‍රභ කරමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-